සියලුම
මහාධිකරණ විනිසුරුවරුන්,
දිසා විනිසුරුවරුන්,
මහේස්ත්‍රාත්වරුන්,
ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් සහ,
අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත,

**<u>අධිකරණ රෙජිස්ට්‍රාර් III ශ්‍රේණියට කුසලතා පදනම මත බඳවා ගැනීම - 2023 සඳහා අයදුම්පත් කැඳවීම.</u>**

අංක 2088/26 සහ 2018.09.11 දිනැති උපලේඛනගත රජයේ නිලධරයන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 8.12.1 ඡේදය යටතේ සඳහන් සියළු සුදුසුකම් සම්පූර්ණ කර ඇති අධිකරණ කළමණාකරණ සහකාර සේවයට අයත් සේවාවක නියුතු නිලධරයන්ගෙන් අධිකරණ රෙජිස්ට්‍රාර් III ශ්‍රේණියට කුසලතා පදනම මත බඳවා ගැනීම සඳහා අයදුම්පත්‍ර කැඳවීමට අධිකරණ සේවා කොමිෂන් සභාව තීරණය කර ඇත.

02. සේවා ව්‍යවස්ථාවේ 8.12.1 හි සඳහන් සුදුසුකම්

(අ) අධිකරණ කළමනාකරණ සහකාර සේවයට අයත් සේවාවක වසර 25 ක සක්‍රිය සහ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති අධිකරණ කළමනාකරණ සහකාර සේවයට අයත් සේවාවක අධි ශ්‍රේණියේ නිලධරයකු වීම.

හෝ

(ආ) අධිකරණ කළමනාකරණ සහකාර සේවයට අයත් සේවාවක I වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර 05 ක සක්‍රිය සහ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එකී සේවා කාලයද ඇතුළුව අධිකරණ කළමනාකරණ සහකාර සේවයට අයත් සේවාවක වසර 25 ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ I වන ශ්‍රේණියේ නිලධරයෙකු වීම.

03. උපලේඛනගත රජයේ නිලධරයන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 8:12:1 ඡේදයෙහි සටහන පරිදි අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට ලක් කර කුසලතා පදනම මත බඳවා ගැනීම සිදුකරනු ඇත. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, අපරාධ නඩු කාර්ය පටිපාටිය, සිවිල් නඩු කාර්ය පටිපාටිය, ආයතන සංග්‍රහය සහ මුදල් රෙගුලාසි, අධිකරණ කළමනාකරණය සහ පරිපාලනය (අධිකරණ වල නඩු භාණ්ඩ භාරකරු තනතුරේ රාජකාරිය පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරනු ඇත.) යන විෂය ක්ෂේත්‍රයන්ට අදාලව අවම වශයෙන් ප්‍රශ්න 05 ක් අයදුම්කරුට ඉදිරිපත් කරනු ඇත. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් සමත් වීම සඳහා අවම වශයෙන් ලකුණු 40% ක් ලබා ගත යුතුය. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයාගේ සිට පහළට ලකුණු අනුපිළිවෙල අනුගමනය කරමින් ඉහත සඳහන් සුදුසුකම් සහිත අයදුම්කරුවන්ගෙන් කුසලතා පදනම මත බඳවා ගැනීම සඳහා වෙන්කල පුරප්පාඩු සංඛ්‍යාවට සමාන අයදුම්කරුවන් සංඛ්‍යාවක් පත්කරනු ලැබිය හැකිය. එසේ වුවද කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් නොපිරවීම සඳහා අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් තීරණය කළ හැකිය.

04. **<u>2023.09.01</u>** දිනට උපලේඛනගත රජයේ නිලධරයන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 8.12.1 හි සඳහන් සුදුසුකම් සම්පූර්ණ කළ නිලධාරීන් පසුපිටෙහි සඳහන් ආකෘතියට අනුව සකසන ලද අයදුම්පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් **<u>2023 ඔක්තෝබර් මස 06 වැනි දින හෝ ඊට පෙර</u>** "ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය, කොළඹ 12." යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්‍ර බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ '<u>අධිකරණ රෙජිස්ට්‍රාර් III ශ්‍රේණියට කුසලතා පදනම මත බඳවා ගැනීම - 2023</u>' යන්න සඳහන් කළ යුතුය.

05. කුමන හේතුවක් නිසාවත් මෙම කාර්යාලයට එවනු ලබන අනෙකුත් ලේඛන සමග අයදුම්පත්‍ර නොඑවිය යුතු අතර අයදුම්පත්‍ර සමග ඊට අදාළ සුදුසුකම් සනාථ කරන ලද සහතික පමණක් එවිය යුතුය. මෙම උපදෙස් නොසලකා එවනු ලබන අයදුම්පත්‍ර හා ලිපි ලේඛන සම්බන්ධයෙන් වග කියනු නොලැබේ. <u>**2023 ඔක්තෝබර් මස 06 වැනි**</u> දිනට පසුව එවන ලබන අයදුම්පත්‍ර සහ නිසි අයුරින් සම්පූර්ණ නොකරන ලද අයදුම්පත්‍ර කිසිඳු දැනුදීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

06. මෙම ලිපිය ඔබ අධිකරණයේ සේවය කරන අධිකරණ කළමනාකරණ සහකාර සේවයට අයත් සේවාවල නියුතු අධි ශ්‍රේණියේ හා I වන ශ්‍රේණියේ නිලධාරීන්ට දැන ගැනීමට සලස්වන්න.

එච්.එස්.සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

2023 සැප්තැම්බර් මස 01 වන දින,
කොළඹ 12
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දීය.

**එච්. සංජීව සෝමරත්න**
**ලේකම්**
**අධිකරණ සේවා කොමිෂන් සභාව,**
**කොළඹ 12.**

ආදර්ශ අයදුම්පත්‍රය

අධිකරණ රෙජිස්ට්‍රාර් III ශ්‍රේණියට කුසලතා පදනම මත බඳවා ගැනීම - 2023

[ ]
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි.)

01. පෞද්ගලික තොරතුරු :

1.1 මුලකුරු සමඟ නම: Mr./Mrs./Miss. ............................................................ ........................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ) උදා : A.P.K. SIRIWARDANA

1.2 සම්පූර්ණ නම:
..............................................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් )

1.3 සම්පූර්ණ නම : (මයා/මිය/මෙනවිය)
..............................................................................................................................
(සිංහලෙන්/දෙමළෙන්)

1.4 පෞද්ගලික ලිපිනය (සිංහලෙන්/දෙමළෙන් ) :
..............................................................................................................................

1.5 පදිංචි දිස්ත්‍රික්කය : ..............................................................................................

1.6 ජාතික හැඳුනුම්පත් අංකය

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | |

1.7 උපන් දිනය :

වර්ෂය: [ | | | ] මාසය: [ | ] දිනය: [ | ]

1.8 ස්ත්‍රී/පුරුෂ භාවය : පුරුෂ - 1 [ ] ස්ත්‍රී – 2 [ ]
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

1.9 දුරකථන අංකය :

ස්ථාවර : ................................ ජංගම:...............................

02. 2.1 දැනට සේවය කරන අධිකරණය: ..................................................................................

2.2 දැනට දරණ තනතුර හා ශ්‍රේණිය: ..................................................................................

2.3

2.3.1 අධිකරණ කළමනාකරණ සේවයේ II ශ්‍රේණියට පත්වූ දිනය:.........................................

2.3.2 එම පත්වීම ස්ථිර කල දිනය: ..................................................................................

2.3.3 අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ I ශ්‍රේණියට උසස්කල දිනය: ......................

2.3.4 අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධි ශ්‍රේණියට උසස් කළ දිනය: ..................

2.4 පෞද්ගලික ලිපි ගොනු අංකය : EA/PF/---------/-----------

2.5 2023.09.01 දිනට අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ මුළු සේවා කාලය .......................

2.6 කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් වූ දිනය
( ප්‍රතිඵල ලේඛනවල සහතික කරන ලද පිටපත් අමුණන්න)

(II ශ්‍රේණිය) I වන කඩඉම: ..........................................................................................................

II වන කඩඉම: ..........................................................................................................

(I ශ්‍රේණිය) ..........................................................................................................

2.7 2023.09.01 දිනට පූර්වාසන්න වසර 05 ක් තුල වැටුප් වර්ධක උපයාගෙන තිබේද?
(උපයාගත් වැටුප් වර්ධක පිළිබඳ විස්තර සඳහන් කරන්න)

| වැටුප් වර්ධක දිනය | වැටුප් පියවර |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

03. ඔබට විරුද්ධව දැනට නොනිමි විනය කටයුත්තක් පවතීද යන්න සහ අවවාද කිරීමක් හැර වෙනත් විනය දඬුවමකට යටත් කර තිබේද යන්න පිළිබඳ විස්තර සඳහන් කරන්න.

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

මෙම ඉල්ලුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් ඇති වන ප්‍රතිඵලය විඳ දරාගැනීමට එකඟ වෙමි. තව ද මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

දිනය ................ නිලධාරියාගේ අත්සන .........................

---

අධිකරණයේ රෙජිස්ට්‍රාර්ගේ සහතිකය

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන .......................................................................................... මයා/මිය/මෙනවිය මෙම අධිකරණයේ .......................................................................... තනතුරේ ....................ශ්‍රේණියේ සේවය කරන බවත්, නිලධාරියාගේ/ නිලධාරිනියගේ පෞද්ගලික ලිපි ගොනුව අනුව ඉහත විස්තර නිවැරදි බවත්, සේවා ව්‍යවස්ථාව අනුව කුසලතා පදනම මත අධිකරණ රෙජිස්ට්‍රාර් III වන ශ්‍රේණියේ තනතුරට අයදුම් කිරීම සඳහා සුදුසුකම් සපුරා ඇති බවත් සහතික කරමි.

දිනය ................ අත්සන .........................
අධිකරණයේ රෙජිස්ට්‍රාර්
(නිල මුද්‍රාව )

## II කොටස

(දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය)

අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙතටයි,

..........................................................................................මහතා /මිය/මෙනවිය මෙම අධිකරණයේ සේවය කරන අතර

01. ඔහු /ඇය 2023.09.01 වන දිනට අධිකරණ කළමනාකරණ සහකාර සේවයට අයත් සේවාවක (අධිකරණ ලිපිකරු/ අධිකරණ භාෂණ පරිවර්තක/ අධිකරණ ලඝු ලේඛක/අධිකරණ යතුරු ලේඛක) වසර 25 ක සක්‍රිය සහ සතුටු දායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති අධිකරණ කළමනාකරණ සහකාර සේවයට අයත් සේවාවක අධි ශ්‍රේණියක නිලධරයෙකු බවත්/ අධිකරණ කළමනාකරණ සහකාර සේවාවක I ශ්‍රේණියේ අවම වශයෙන් වසර 05 ක සක්‍රිය සහ සතුටු දායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එකී සේවා කාලයද ඇතුළුව අධිකරණ කළමනාකරණ සහකාර සේවයට අයත් සේවාවක වසර 25 ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති අධිකරණ කළමනාකරණ සහකාර සේවාවක I ශ්‍රේණියේ නිලධාරියෙකු බවත්,(අදාල නොවන වචන කපා හරින්න)

02. 2023.09.01 දිනට පූර්වයෙන් වූ වසර 05 තුල වැටුප් වර්ධක උපයාගෙන ඇති බවත්/නොමැති බවත්,

03. සේවා කාලය තුල අඩ වැටුප් ..........ක් සහ වැටුප් රහිත නිවාඩු .........ක් ලබාගෙන ඇති බවත්/ අඩ වැටුප් සහ වැටුප් රහිත නිවාඩු ලබාගෙන නොමැති බවත්,

04. එම කාලය තුල කිසිදු විනයානුකුල දඩුවමකට (අවවාද කිරීමක් හැර) යටත් කර ඇති/නොමැති බවත්, ( විනය දඩුවමකට යටත් කර ඇත්නම් විස්තර සඳහන් කරන්න.)

05. නිලධාරියාට/නිලධාරිනියට විරුද්ධව නොනිමි විනය කටයුතු කිසිවක් නොමැති බවත් ඉදිරියේදී විනය ක්‍රියාමාර්ග ගැනීමට දැනට අදහස් නොකරන බවත්, සහතික කරමි.

ඉහත සඳහන් සියලු කරුණු නිලධාරියාගේ/නිලධාරිනියගේ පුද්ගලික ලිපි ගොනුව පරීක්ෂා කර බලා නිවැරදි බව සනාථ කරන අතර සේවා ව්‍යවස්ථාව අනුව අධිකරණ රෙජිස්ට්‍රාර් සේවයේ III වන ශ්‍රේණියට කුසලතා පදනම මත ඉල්ලුම් කිරීමට සුදුසුකම් සපුරා ඇති බැවින් නිලධාරියා /නිලධාරිනියගේ මෙම ඉල්ලුම් පත්‍රය නිර්දේශ කර ඉදිරිපත් කරමි.

දිනය :-

..............................................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
නම
පදවිය
(නිල මුද්‍රාව තබන්න)